Australian Government
Department of Immigration and Citizenship

# වැඩිහිටි සංක්‍රමණ ඉංග්‍රීසි වැඩසටහන (Adult Migrant English Program (AMEP)) සැපයීම සම්බන්ධයෙන් පුද්ගලික තොරතුරු රැස්කිරීම

සංක්‍රමණ සහ පුරවැසි දෙපාර්තමේන්තුව (දෙපාර්තමේන්තුව) වෙනුවෙන් ඔබගේ පුද්ගලික තොරතුරු ලබාගන්නා ලෙස AMEP සේවා සපයන්නන්ගෙන් ඉල්ලා ඇත. *1958 සංක්‍රමණ පනතේ (Migration Act 1958)* 2 වන කොටස යටතේ තොරතුරු රැස්කිරීම අනුමත කර ඇත.

රජයේ වෙනත් වැඩසටහන් සහ සේවා  පරිපාලනය කිරීමේ අරමුණෙන් රැස්කරගන්නා තොරතුරු පහත දැක්වෙන වෙනත් ආයතන හෝ සංවිධාන වෙත හෙළිදරව් කල හැකිය:

- ළමා රැකවරණ මධ්‍යසථාන. ඒ අනුව සුදුසුකම් ලබන AMEP සේවාදායකයන් හට ළමා රැකවරණ ලබාදිය හැකිවේ
- AMEP Settlement Language Pathways to Employment and Training වැඩසටහන්වලට සම්බන්ධවන සේවායෝජකයන්
- අළුතින් පැමිණි සංක්‍රමණිකයන් හට පදිංචිවීමේ සේවා ලබාදීමට දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම් ඇතිකරගෙන ඇති සේවා සපයන්නන්
- පහත සඳහන් රජයේ දෙපාර්තමේන්තු:
    - රජයේ දීමනා සහ ප්‍රතිලාභ කළමණාකරණය කරන, සෙන්ටර්ලින්ක් (Centrelink);
    - රැකීරක්ෂා සහ රැකියා ස්ථාන සම්බන්ධතා පිළිබඳ දෙපාර්තමේන්තුව (Department of Employment and Workplace Relations (DEEWR)); සහ
    - ජොබ් සර්විසස් ඕස්ට්‍රේලියා (Job Services Australia) සහ ආබාධිත රැකියා සේවා (Disability Employment Services) ඇතුළු DEEWR වෙනුවෙන් සේවා සැපයීමට ගිවිසුම් ඇතිකරගත් සේවා සපයන්නන
- විමර්ශන හෝ ආපදා තත්වයන් සම්බන්ධයෙන් උපකාර කරන ෆෙඩරල්, ප්‍රාන්ත සහ සන්තක ප්‍රදේශවලට අයත් පොලිස් දෙපාර්තමේන්තු

මීට අමතරව, ඔබගේ පුද්ගලික තොරතුරු හෙළිදරව් කල හැකි ආයතන සම්බන්ධයෙන් තොරතුරු පත්‍රිකා පෝරම 993i Safeguarding your personal information (ඔබගේ පුද්ගලික තොරතුරු ආරක්ෂාකර ගැනීම) මගින් වැඩිදුර විස්තර ලබාදේ. දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන www.immi.gov.au/allforms/ වෙතින් හෝ දෙපාර්තමේන්තුවේ ඕනෑම කාර්යාලයක් වෙතින් හෝ විදේශ දූත මෙහෙවරක්- වෙතින් පෝරම 993i ලබාගත හැකිවේ.

## ඔබගේ අයිතිවාසිකම්

සේවා සපයන්නා හෝ දෙපාර්තමේන්තුව මගින් ඔබගේ තොරතුරු වැරදි ආකාරයට රැස්කර හෝ පරිහරණය කර ඇති බවට ඔබ විශ්වාස කරයි නම්, පහත ලිපිනයට ලිවිය හැකිවේ:

The Director
Freedom of Information and Privacy Policy Section
Department of Immigration and Citizenship
PO Box 25
BELCONNEN  ACT  2616

එසේ නැතිනම් privacy@immi.gov.au වෙත ඊමේල් කරන්න.

ඔබගේ පැමිණිල්ල විමර්ශනය කරනු ලබන අතර ප්‍රතිඵලය ඔබහට දැනුම් දෙනු ඇත.